# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2047/29 - 2017 නොවැම්බර් මස 29 වැනි බදාදා - 2017.11.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය )**

**7 වෙනි වගන්තිය යටතේ දැන්වීමයි**

*මගේ අංකය*: DSO/HOM/LAC/102.

*ඉඩම් අමාත්‍යංශයේ යොමු අංකය*:4-3/172017/E/142.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් අදහස් කරන බව, 1964 අංක 28 දරන ඉඩම් අත්කරගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කරගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 587 මත්තේගොඩ බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් 2017.10.25 දාතමින් සහතික කරන ලද, කැඩැස්තර සිතියම් අංක 520008 හි කලාපය 01, පත්‍ර අංක 06 හි කැබලි අංක 115 වශයෙන් දැක්වෙන, පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටස. මායිම්:

**01 කැබලි අංක 115 — කැකුණගහවත්ත, මුල්හිමිකම් පාන්නා: ප්‍රයිම් ලැන්ඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය, අංක 75, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 08; ප්‍රමාණය: හෙක්. 4 .0469 (අක්කර10) ක්.**

*උතුරට*: කසි 520029හි කලාපය 03, කැබලි අංක 114 සහ කසි 520029 හි කලාපය 01, (මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරිය), *නැගෙනහිරට*: කැබලි අංක 114, කසි 520029 හි කලාපය 01, (මාර්ගය, මාර්ග සංවර්ධන අධිකාරිය) සහ කැබලි අංක 116. *දකුණට*: කැබලි අංක 116, 6 සහ කලාපය 02. *බස්නාහිරට*: කලාපය 02, කසි 520029 හි කලාපය 07 සහ කසි 520029 හි කලාපය 03.

ඉහත නම් සඳහන් ඉඩමට හිමිකම්,අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් බලයලත් අයවලුන් හෝ 2018 පෙබරවාරි මස 19 දින පූ.භා. 9.00 ට හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2018 පෙබරවාරි මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ජී. එස්. කේ. කන්නන්ගර,
ප්‍රාදේශීය ලේකම්,
හෝමාගම.

2017 නොවැම්බර් මස 24 වැනි දින,
හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

12 - 448

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 026707 – 17 (2017/11)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.